සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම - 2016
இரண்டாம் தவணை மதிப்பீடு - 2016
Second Term Evaluation - 2016

6 ශ්‍රේණිය
தரம் 6
Grade 6

චිත්‍ර I,II පත්‍ර
சித்திரம் வினாத்தாள்- I,II
Art Paper I,II

පැය දෙකයි
இரண்டு மணித்தியாலங்கள்
Two Hours

❖ සියළුම ප්‍රශ්න සඳහා පිළිතුරු මෙම පත්‍රයේම සපයන්න.
❖ ප්‍රශ්න අංක 01-05 දක්වා අසා ඇති ප්‍රශ්න වලට පහත රූප ඇසුරින් නිවැරදි පිළිතුර තෝරා අදාල අක්ෂරය තිත් ඉර මත ලියන්න.


A


B


C


D


E

01. වර්ණ කොළ කැබලි ඉරා අලවා කරන ලද නිර්මාණයකි. (................)
02. ඉස්ලාම් අක්ෂර චිත්‍ර කලාවට අයත් නිර්මාණයකි. (................)
03. හින්දු ආගමික ගෘහ නිර්මාණ අංගයකි. (................)
04. සීල් මුද්‍රණයක් ඇසුරින් කරන ලද නිර්මාණයකි. (................)
05. සම්ප්‍රදායික සැරසිලි මූලිකාංගයකි. (................)

❖ අංක 06-10 දක්වා අසා ඇති ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

06. ඔබ විසින් "ළමා උද්‍යානයක්" යන තේමාව යටතේ චිත්‍රයක් සංරචනය කිරීමේදී දක්නට ලැබෙනුයේ.
   i. නිර්මිත පරිසරයකි.
   ii. ස්වාභාවික පරිසරයකි.
   iii. නිසංසල පරිසරයකි.
   iv. ගුප්ත පරිසරයකි.

07. පන්ති කාමරයේදී ගෝලාකාර වස්තුවක් බලා ඇඳීමේදී එම වස්තුව,
   i. සෑම දිශාවටම එකම ආකාරයට දිස් වේ.
   ii. ඇස් මට්ටමින් බැලුවිට විශාලව දිස්වේ.
   iii. ඇස් මට්ටමින් පහලට බැලුවිට විශාලව දිස්වේ.
   iv. වස්තුව මධ්‍යයෙන් හැකිලී පෙනේ.

08. මූලික වර්ණ යොදා මල් මෝස්තරයක් කිරීමට ගුරුතුමිය ඔබට උපදෙස් දුන්නේ නම් ඔබ තෝරා ගන්නා වර්ණ කාණ්ඩය කුමක්ද ?
   i. කලු, නිල්, කොළ
   ii. නිල්, කහ, රතු
   iii. රතු, කහ, රෝස
   iv. නිල්, කොළ, දම්

09. සත්ව රූපයක් ඇඹීම සඳහා ඔබ යොදා ගන්නා පහසුම මාධ්‍ය කුමක් ද?
   i. සබන්
   ii. මැටි
   iii. ගල්
   iv. ලී

10. බෞද්ධ ස්තූපයක විශාලම අංගය වනුයේ,
   i. හතරැස් කොටුව යි.
   ii. කොත් කැරැල්ල යි.
   iii. ධාතු ගර්භය යි.
   iv. දේවතා කොටුව යි.

115

❖ අංක 11 - 15 දක්වා පහත රූප සටහන් ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට කෙටි පිළිතුර ලියන්න.



A B C D E

11. A රූප සටහනින් දැක්වෙන සිංහල සැරසිලි ඒකකය හඳුන්වන්න. (..........................................)

12. B රූප සටහනින් දැක්වෙන දාගැබෙහි ධාතු ගර්භයෙහි හැඩය කුමක්ද? (..........................................)

13. C රූප සටහනින් දැක්වෙන සිංහල සැරසිලි ඒකක වර්ගීකරණය යටතේ කුමන ගණයට අයත්වේද? (..........................................)

14. D රූප සටහනින් දැක්වෙන ඝන්ඨාකාර චෛත්‍යයක් සඳහා උදාහරණයක් දෙන්න. (..........................................)

15. E රූප සටහනින් දැක්වෙන සැරසිලි මෝස්තර කුමන නමකින් හැඳින්වේද ? (..........................................)

❖ අංක 16-20 දක්වා ප්‍රකාශන සඳහා නිවැරදි නම් (✓) ලකුණ ද , වැරදි නම් (x) ලකුණ ද යොදන්න.

16. සිදුහත් කුමරුන්ගේ ඉපදීම පමණක් මුල් කොට ගෙන වෙසක් උත්සවය කරනු ලබයි. (............)

17. පොත් පිටකවරයක් නිර්මාණය ග්‍රැෆික් සැලසුම් ගණයට අයත් වේ. (............)

18. නිල් සහ කහ එකතු වීමෙන් කොළ යන ද්විතියික වර්ණය සෑදේ. (............)

19. තෛපොංගල් උත්සවය සමරනු ලබන්නේ ක්‍රිස්තියානි බැතිමතුන්ය. (............)

20. ඉන්දියාවේ සාංචි ස්ථූපයේ හර්මිකා ලංකාවේ ස්ථූප වල හතරැස් කොටුව ලෙස හැඳින්වේ. (............)

(ලකුණු 2 x 20 = 40)

## II පත්‍රය

- පහත දැක්වෙන මාතෘකා අතරින් එක් මාතෘකාවක් තෝරා වර්ණවත් චිත්‍රයක් අඳින්න.

1. පන්සල් යන පුංචි අපි.
2. වැලි බත් උයන නංගිලා මල්ලිලා.
3. ගං ඉවුරේ අලි රංචුවක්.
4. පාසලේ විවේක කාලය.
5. මල් කොළ ඇසුරින් චිත්ත රෙද්දකට මෝස්තරයක් අඳින්න.
6. වෙසක් සුභ පැතුම් පතක් නිර්මාණය කරන්න.
7. ළමා කතන්දර පොතකට පිටකවරයක් නිර්මාණය කරන්න.
8. සරල ජ්‍යාමිතික හැඩ තල ඇසුරින් මේස රෙද්දකට මෝස්තරයක් නිර්මාණය කරන්න.

( ලකුණු 60)



116